9 ශ්‍රේණිය :-    චිත්‍ර සංරචනය  -    01

නිපුණතාව :- 1.0 -පරිසරය ආශ්‍රිත  තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.

නිපුණතා මට්ටම 1.2 :-පාරිසරික,සමාජීය,ආගමික හා ඓතිහාසික තේමා ආශ්‍රිත චිත්‍ර නිර්මාණ කරයි.

ක්‍රියාකාරකම :- 1.2.1:-“වැසි දිනයක්’’ චිත්‍රණය කරමු.

















## <u>වැසි දිනයක්</u>

ඉහත දී ඇති ඡායාරූප හොඳින් අධ්‍යනය කරන්න.

- ❖ ඒ ඇසුරින් වර්ෂාව සහිත දිනයක අවට පරිසරය ,මානව ක්‍රියාකාරම් පිළිබඳ හොඳින් නිරීක්ෂණය කර ඒ පිළිබඳ මතකය අවදිකරන්න.

- ❖ වැසි දිනයක "කුඩය" අත්‍යාවශ්‍ය දෙයක් .එය අදින ආකාරය එය දිගහැර උසුලාගෙන යන ආකාරය දළසටහන්කිහිපයක්(පිරිමිරුවක්,කාන්තාරුවක්,දරුවෙක්..) ඇඳ අත හුරුකරගන්න.

- ❖ කුඩයක් නැති අය අත ඇති දේ හෝ හිසට තබාගෙන ඉක්මනින් ගමන්කරන ආකාරයට මානව රූප කිහිපයක්ද දළ සටහන් ලෙස අඳින්න.

- ❖ දළ සටහන් ඇඳ අතහුරුවක් ලබාගෙන "වැසිදිනයක්" මාතෘකාව යටතේ චිත්‍ර සංරචනයක් කරන්න.මෙහිදී අවම වශයෙන් මානව රූප 4-5ක් පමණවත් යොදාගන්න.

- ❖ මානව රූප සංරචනයේදී ළඟ ඇති රූප විශාලවත් ක්‍රමයෙන් ඈතට යනවිට රූප ප්‍රමාණයෙන් කුඩාවන ලෙසත් ඇඳීමට උත්සහකරන්න.එමෙන්ම වැඩිමහළු අය අඳිනවිට ප්‍රමාණයෙන් හා උසින් වැඩිවත් ළමුන් ඇඳීමේදී උස ප්‍රමාණය තරමක් අඩුවෙන්ද අඳින්න.ඒ වගේම ඈත ඇති ගොඩනැඟිලි ගස් ආදියද සිතුවමට ගැලපෙන ලෙස පර්යාවලෝක ලක්ෂණ ඇතුළත්කොට කුඩාවට ඇඳිය හැකිය.

- ❖ දිය සායම් වර්ණ භාවිතා කරන්නේනම් දළ සටහන් තදනොකර ඇඳීම වැදගත්වේ.

- ❖ මේ ආකාරයට වැසි දිනයක ස්වභාවය මතුවන ලෙස චිත්‍රයක පැන්සල් සටහනක් ගොඩනඟන්න.

<u>වර්ණ කිරීම.</u>

- ❖ මෙහිදී ශීත වර්ණ භාවිතය වැදගත්වේ.(නිල්,නිල් ප්‍රභේද,කොළ,කළු,දුඹුරු,වැනි වර්ණ)
- ❖ පරිසරය අඳුරු අපැහැදිළි ස්වරූපය දැක්වීම වැදගත්වේ.
- ❖ වර්ණ කිරීමේදී මානව රූපවලට එළිය අඳුර යොදමින් ඒවා ඉස්මතුකිරීම වැදගත්වේ.



